Department of Education, Sabaragamuwa Province/ Weekly School

**පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල**

ශ්‍රේණිය : 6

විෂය : ගණිතය

සතිය : 21

**පාඩම :- සරල රේඛීය තල රූප**

**කාලච්ඡේද ගණන :- 04**

- ගණිතය දෙවන පෙළපොතේ 1 වන පිටුව හොඳින් අධ්‍යයනය කරන්න. තල රූපයක් යනු කුමක්දැයි හඳුන්වන්න.

| |
|---|
| සරල රේඛා ඛණ්ඩ හා වක්‍ර රේඛා ඛණ්ඩ වලින් සමන්විත එකම තලයක අඳින ලද රූප **තල රූප** නම් වේ. |


උදා:-




- බෝලයක මතුපිට තලරූපයක් නොවීමට හේතු ලියන්න.

පහත දැක්වෙන රූපවල A හා B ලක්ෂ්‍යයන් දෙක රූපයේ ඇති රේඛා කැපී නොයන සේ යා කිරීමට උත්සාහ කරන්න.

උදා:-





ඉහත රූප අතරින් රූපයේ රේඛා කැපී නොයන සේ යා කල හැකි රූප මොනවාද?

රේඛා ඛණ්ඩවලින් සම්පූර්ණයෙන්ම වට වී ඇති තල රූප 3 ක් අඳින්න.


උදා:-



| |
|---|
| රේඛා ඛණ්ඩවලින් සම්පූර්ණයෙන්ම වට වී ඇති තල රූපයක් සංවෘත තල රූපයක් ලෙස හැඳින්වේ. |


රේඛා ඛණ්ඩවලින් සම්පූර්ණයෙන්ම වට වී නොමැති තල රූප 3 ක් අඳින්න.

උදා:-



| |
|---|
| රේඛා ඛණ්ඩවලින් සම්පූර්ණයෙන්ම වට වී නොමැති තල රූපයක් විවෘත තල රූපයක් ලෙස හැඳින්වේ. |

පහත දැක්වෙන රූප අතරින් සංවෘත රූප හා විවෘත රූප තෝරා ලියන්න.




- ඔබ කැමති සංවෘත රූපයක් අඳින්න. එහි අභ්‍යන්තර ලක්ෂ්‍යයක් හා බාහිර ලක්ෂ්‍යයක් ලකුණු කරන්න.
- ඔබ ඇඳි සංවෘත රූපයේ රේඛා නොකැපෙන සේ මෙම ලක්ෂ්‍ය දෙක යා කල හැකි දැයි බලන්න.
- එමඟින් සංවෘත රූපයක ලක්ෂණයක් හඳුනා ගෙන ඔබේ පන්තියේ වෙනත් අයෙකුට විස්තර කර දෙන්න.

පෙළපොතේ 2 වන පිටුවේ 12.1 අභ්‍යාසය නිවැරදිව සම්පූර්ණ කරන්න.

සරල රේඛා ඛණ්ඩවලින් පමණක් සමන්විත තලරූප 3 ක් අඳින්න.


උදා:-



| |
|---|
| සරල රේඛා ඛණ්ඩවලින් පමණක් සමන්විත සංවෘත තලරූප, සරල රේඛීය සංවෘත තල රූප නම් වේ. |

සරල රේඛීය සංවෘත තල රූප නොවන අවස්ථා දැක්වෙන රූප 3ක් අඳින්න.


උදා:-




පෙළපොතේ 3 වන පිටුවේ 12.2 අභ්‍යාසය නිවැරදිව සම්පූර්ණ කරන්න. ඔබට මතුවන ගැටළු නිවැරදි කරගන්න.

- පෙළපොතේ 4 පිටුවේ සරල රේඛීය තල රූපවල අංග හොඳින් අධ්‍යයනය කරන්න.

සංවෘත සරල රේඛීය තල රූපයක පාදය, කෝණය නිවැරදිව හඳුනා ගන්න.




පහත රූපයේ දැක්වෙන පාද හා කෝණ හඳුන්වන්න.



පෙළපොතේ 4, 5 පිටු හොඳින් අධ්‍යයනය කරන්න. ත්‍රිකෝණ හා චතුරස්‍රය යනු කුමක්දැයි නිවැරදිව විස්තර කරන්න.

පහත දැක්වෙන රූප හොඳින් නිරීක්ෂණය කරන්න.



ඉහත රූප අනුව පහත වාක්‍යවල නුසුදුසු වචනය  කපා දමන්න.

- රූප සියල්ලම සංවෘතය / විවෘතය
- රූප සියල්ලේම රේඛා සරල රේඛීය වේ / නො වේ.
- රූප සියල්ලේම මුලු දෙකක් / තුනක් බැගින් ඇත.
- රූප සියල්ලේම රේඛා ඛණ්ඩ දෙකක් / තුනක් බැගින් ඇත.
- මෙම හැඩයට ත්‍රිකෝණය / චතුරස්‍රය යැයි කියමු.

<u>චතුරස්‍රවල විවිධ අවස්ථා හා ඒවායේ ලක්ෂණ අනුව චතුරස්‍ර වර්ග හඳුනා ගැනීම.</u>

පෙළපොතේ 5,6,7 පිටු හොඳින් අධ්‍යයනය කරන්න. එහි දැක්වෙන ලක්ෂණ අනුව,

ත්‍රපීසියම
සමාන්තරාස්‍රය
රොම්බසය
සෘජුකෝණාස්‍රය
සමචතුරස්‍රය

යන චතුරස්‍රවල ලක්ෂණ හඳුනා ගනිමින් ඒවායේ රූප සටහන් අඳින්න. එක් එක් චතුරස්‍රයේ විශේෂ ලක්ෂණ ලියන්න.

පෙළපොතේ 7 වන පිටුව බලන්න. 12.3 අභ්‍යාසය නිවැරදිව සම්පූර්ණ කරන්න.
ඔබ සම්පූර්ණ කල අභ්‍යාසය ගුරුතුමා සමඟ සාකච්ඡා කර ගැටලු අවස්ථා නිවැරදි කරගන්න.

පෙළපොතේ 9 වන පිටුවේ දැක්වෙන පාඩමට අදාල සාරාංශය හොඳින් කියවන්න. තවදුරටත් සරල රේඛීය සංවෘත තල රූපවල ලක්ෂණ හඳුනාගන්න.